# සමාජ සහකම්පනය ඇති කිරීම උදෙසා බෞද්ධාගමික සංකල්පයන්හි උපයෝගීතාව පිළිබඳ විමසුමක්

*එච්.එම්.එන්.එම්.ඒකනායක*[1]

මිනිසුන් එකිනෙකා අතර සහකම්පනයෙන් කටයුතු කිරීමට ආගමික සංකල්ප මඟ පෙන්වන ලදී. බෞද්ධාගමික සංකල්පයන් මඟින් සමාජ සහකම්පනය ඇති කිරීම උදෙසා දක්වා ඇති මතවාද හඳුනා ගැනීම මෙම පර්යේෂණයේ අරමුණ වේ. සමාජ සහකම්පනය ඇති කිරීම උදෙසා බෞද්ධාගමික සංකල්පයන්හි උපයෝගීතාව කෙබඳු ද යන්න මෙම පර්යේෂණයේ ගැටලුව වේ. පර්යේෂණ ක්‍රමවේදය ලෙස යොදාගනු ලැබුවේ පුස්තකාලය අධ්‍යයනය තුළින් එක්රැස් කළ දත්ත ඓතිහාසික සන්සන්දනාත්මක ක්‍රමය යටතේ විශ්ලේෂණය කිරීමයි. සහකම්පනය සැබැවින් ම මානව හිතවාදී ගුණයකි. එහි ලා පාලකයා ජනතාව හා අන්‍යෝන්‍ය සබඳතාවෙන් කටයුතු කළ යුතු ය. පාලනයේ දී හිංසාව පිටු දකිමින් ජනතාව විෂයෙහි යහපත් පාලනයක නිරත විය යුතු අතර අන්‍ය මත ඉවසමින් ක්‍රියා කළ යුතු වේ. පරමාදර්ශී රජු පිළිබඳ දක්වන දීඝ නිකායේ චක්කවත්තී සීහනාද සූත්‍රයේ දැහැමි බවින් සාර්ථක පාලනයක් ගෙන යාමත් (ධම්මිකො ධම්ම රාජා) එම පාලනය මිනිසුන්ට පමණක් නො ව මෘග පක්ෂීන්ට පවා ආරක්ෂාව ලබා දෙන්නක් බවත් (රක්ඛාවරණගුත්ති සංවිදහස්සු) දක්වා තිබේ. සතර සංග්‍රහ වස්තු දක්වන සිගාලෝවාද සූත්‍රයේ දී දානය, ප්‍රිය වචනය මෙන් ම අර්ථ චරියාව වන අනුන්ට වැඩ පිණිස කටයුතු කිරීමත් සියලු දෙනාට ම සැප දායකත්වයට පත් කිරීමත් පාලකයාගේ යුතුකම වේ. පත්තකම්ම සූත්‍රයේ සඳහන් පංච ශීලය සමාජ සුරක්ෂිතතාව සඳහා සෘජු ව බලපායි. අන්‍යයන් ගැන සිතමින් අන්සතු දේ ආරක්ෂා කිරීමත් ගෘහස්ත සදාචාරය සුරැකීමත් බොරුවෙන් වැලැකී සහකම්පනයෙන් ක්‍රියා කිරීමත් සමාජ සුරක්ෂිතතාවට හේතු වන බව එහි පෙන්වා දී තිබේ. සතර සංග්‍රහ කිරීම නම් තමා හා සමාන ව අන්‍යයන් පිළිබඳ චින්තනය සකස් කර ගැනීමට ඇති හැකියාවයි, සහකම්පනයයි. සංයුක්ත නිකායේ වේළුද්වාර සූත්‍රයේ ‘අත්තූපනායික ධම්ම පරියාය’ යනුවෙන් දැක්වෙන්නේ මෙම ලක්ෂණයයි. බුද්ධ නියමයට අනුව මිනිසා කෙරෙහි පමණක් නො ව ජීවී පරිසරය කෙරෙහි සහකම්පනයෙන් ක්‍රියා කිරීම, ආරක්ෂා කිරීම රාජ්‍යය තාන්ත්‍රික වගකීමක් වේ. දීඝ නිකායේ චක්කවත්තිසීහනාද සූත්‍රයේ දස සක්විතිවත් පැහැදිලි කරමින් මෘග පක්ෂි සමූහයාට දැහැමි ව ආරක්ෂාව සැලසිය යුතු බව අවධාරණය කර ඇත. බුදු දහමේ මූලික ඉගැන්වීම්වල අරමුණ වී ඇත්තේ පාලකයා, ජනතාව හා පරිසරය විෂයෙහි අන්‍යෝන්‍ය සබඳතාව ඇති කරමින් සදාචාරවත් යුක්තිගරුක සමාජයක් බිහි කිරීම ය. බෞද්ධාගමික සංකල්පයන් මඟින් සහකම්පනයෙන් යුත් සමාජයක් නිර්මාණය උපායමාර්ගික ව සිදු කර ඇති බව මෙමඟින් හඳුනා ගත හැකි ය.

***ප්‍රමුඛ පද:*** අන්‍යෝන්‍ය සබඳතාව, බුදු දහම, සමාජය, සහකම්පනය, සංකල්ප

---

[1] ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ, nimeshaekanayake65@gmail.com